21 වන පිටුවෙන් (තාරකා විජිතය)

එහි සිය අත්සන යෙදුවේ ය. ඇයට පිටුපසින් සිටි පුද්ගලයා අනුරාධගේ නෙත ගැටුණේ තරුණයා ඔහුට ස්තුති කර ආපස හැරෙන මොහොතේදී ය. දින ගණකින් නොකැපූ රැවුලින් ද අවුල්ව ගිය කොණ්ඩයෙන් හා පොඩි වූ ඇඳුමකින් සැරසී සිටින මේ පුද්ගලයා දිලීප නොවේ ද?

''.. දි.. දිලීප..'' අනුරාධ මිමිණුවේ ය. දිලීප ගල් රුවක් සේ අනුරාධ දෙස බලා සිටියේ ය. ඇසිය යුතු දෙයක් හෝ කළ යුතු දෙයක් හෝ අනුරාධට සිතා ගත නොහැකි විය. ''..ෆි.. ෆිල්ම් එක බැලුව ද..?'' සිතා ගත හැකි වූ එකම පැනය ඔහුගේ මුවින් පිට විය.

''මිස්ටර් කීර්ති බණ්ඩාර.. මං එයි කියල තමුසෙ හිතුවෙ නැහැ නේද..?'' දිලීප පහත් හඬින් ඇසුවේ ය. අනුරාධ වට පිට බැලුවේ කිසිවකු හෝ අසා සිටින්නේදැයි සැක හැර ගන්නටය. නිෂාධි තවමත් ප්‍රේක්ෂකාගාරයේ ය. එය මහත් සහනයකි. ඇය මේ මොහොතේ මෙතැන සිටියා නම් සිදුවන්නේ මහත් ව්‍යසනයකි.

''තමුසෙට ලැජ්ජාවක් නැති වුණාට මට ලැජ්ජාවක් තියෙනවා..'' දිලීප නැවතත් කීවේ ය. ''... ඒ හින්දයි හෙමින් කතා කරන්නෙ.. ''

දිලීප කිසිවක් නොකියා අසා සිටියේ ය. මෙය වාදයකට පැටලෙන්නට සුදුසු තැනක් හෝ වේලාවක් හෝ නොවේ.

''.. තමුසෙටයි මටයි බේරගන්න දෙයක් තියෙනවා.. ඒක මෙතැන මෙහම කරන්න බෑ.. මං ඉවසගෙන හිටියෙ තමුසෙගෙ ෂෝ ඒක ඉවරවෙනකල්.. මං දන්නව එතකල් තමුසෙට නිදහසක් නැති බව.. දැන් ෂෝ එක ඉවරයි.. දැන් තමුසෙට පුලුවන් ටිකක් නිදහසේ එළියට බහින්න.. මට තමුසෙව නිදහසේ හමුවෙන්න ඕනෙ.. ''

''ප්‍රශ්නයක් නෑ.. හමුවෙමු..''

''අන්න හරි.. තමුසෙ මට බය නෑ.. මං ඒකට කැමතියි.. ''

''දිලීප.. මං ඔයා හමුවෙන්න කැමතියි.. ඒත් ඔයා මේ විදිහට බීගෙන නම් එදාටත් එන්නෙ ඒ අදහස අත්ඇරදාමු.. මං බීගත් මිනිස්සු එක්ක කතා කරන්න කැමති නෑ..'' අනුරාධ කිවේ සිතේ නැග එන කෝපය මැඩගන්නට උත්සාහ ගන්නා අතරේදී ය.

''මං.. මං බේබද්දෙක් තමයි ඕයි.. ඒත් මං ගෑනු හොරෙක් නෙවෙයි.. මං අනුන්ගෙ ගෑනු හොරකම් කරන්න දැගලුවේ නැහැ.. ඒක මතක තියාගන්නවා.. ඒක මතක තියාගන්නවා..''

''හොඳයි.. අපි මේ කතාව දැන් මෙතනින් නවත්තමු.. කවද ද මාව හමුවෙන්න ඕනෙ.. කොතනදිදි ද?'' අනුරාධ ඇසුවේ කතාව ඉක්මණින් හමාර කරන අදහසින් ය.

''හෙට.. හෙට.. මං.. මං දන්නව තමුසෙ නැවතිලා ඉන්න තැන.. ඒත් මං එතෙන්ට එන්නෑ.. අපි මේ ප්‍රශ්නෙ ගොඩින් ඉවර කරගන්න ඕනෙ.. තව මිනිස්සු ඒක දැනගන්න ඕනෙ නෑ.. ඒ හින්දා මං තමුසෙ ඉන්න තැනට එන්නෙ නෑ.. හෙට උදේ දහයට තමුසෙ එනව එපින් ස්ටේෂන් එකට.. එන්න දන්නැත්නං ටැක්සියකට නැගල කියනව.. තමුසෙව එතනින් බස්සවයි.. මේ තමුසෙයි මායි අතර ගනුදෙනුවක්.. වෙන කවුරුවත් මේක දැනගන්න ඕනෙ නැහැ.. අඩුම තරමින් නිෂාධිවත් මේක දැනගන්න ඕනෙ නෑ.. තමුසෙයි මායි.. පිරිමි දෙන්නෙක් විදිහට හමුවෙලා මේක බේරගමු.. මං යනව.. අන්න තමුසෙගෙ රසිකාවියෝ පුල පුලා බලා ඉන්නවා කතා කරන්න.. පුලුවන් නං එයින් එක්කෙනෙක් දැලේ දාගන්නවා.. '' දිලීප ආපසු හැරුණේ ය. සිනමා පටය නරඹා ශාලාවෙන් පිටතට එන සෙනගට මුහුණ නොදී ඔහු වහ වහා පඩි පෙළ බැස නොපෙනී ගියේ ය.

අනුරාධ එදෙසින් දෑස් ඉවත් කර ගත්තේ කැළඹුණ සිතින් ය. සිත මේ තරම් කැළඹී සිටිද්දී තමා සමග කතා කරන්නට බලා සිටින මේ මිනිසුන් ගැහැණුන් සමග කෙසේ සිනා සී කතා කරන්න ද? ඔහු ගැඹුරු හුස්මකින් ළය පුරවා ගත්තේ ය. දැන් රඟපෑමක් කළ යුතුව ඇත.

********

''අපි කොහෙද යන්නෙ...?' අනාරාධ ඇසුවේ කාරයේ ඉදිරි අසුණේ වාඩි වන අතර ය. දිලීප සුක්කානම මත රඳවාගත් දෑතින් යුතුව ඉදිරිය බලා සිටියේ ය. ඔහු මනාව ඇඳ පැළඳ සිටින බවත් ඉතා සන්සුන් ව සිටින බවත් අනුරාධට පෙනුණි. පෙර දිනයේ තිබූ කාලකන්නි පෙනුම වෙනුවට ඉතා වැදගත් පෙනුමක් ඔහු වෙතින් දිස් විය. ඔහු වෙතින් හමා ආ සුවඳ විලවුන් සුවඳින් කාරය පිරී තිබුණි.

''අපි කොහෙද යන්නෙ...?' අනුරාධ නැවත අසුවේ ය.

''කතා කරන්න පුලුවන් තැනකට..'' දිලීප අනුරාධ දෙස නොබලාම කීවේ ය. ''..අනුරාධ උදේට කෑම ගත්ත ද..?'' ඔහු ඇසුවේ ය.

''මං ඉක්මණට ආපහු යන්න ඕනෙ දිලීප..'' අනුරාධ දිලීප ගේ ප්‍රශ්නයට පිලිතුරක් දෙනු වෙනුවට කීවේ ය.

''ඔව්.. අපි ඉක්මන් කරමු...'' දිලීප කීවේ ය. ''.. මාත් කැමති නෑ වැඩි වෙලාවක් ගන්න..''

කාරය ඩෝල්ටන් පාරෙන් නිදහස් මාර්ගයට හරවා ගත් දිලීප එහි වේගය වැඩි කළේ ය.

'හුඟක් දුර යනවද..? මං කාටවත් කියල ආවෙත් නැහැ.'' අනුරාධ නැවත ඇසුවේ ය. නිෂාධිට මේ ගමන පිළිබඳව නොකියා සිටීමෙන් තමා විශාල අනුවණ කමක් කළ බවක් හදිසියේ ම අනුරාධට දැනුණි.

''කාටවත් කියන්න අවශ්‍ය කමක් නැහැ.. අපි හුඟක් දුර යන එකක් නැහැ අනුරාධ..''

අනුරාධ දකුණට හැරී දිලීපගේ මුහුණ දෙස බැලුවේ ය. ඔහු ඉතා තැන්පත් ලෙස රිය පදවමින් සිටියි. ක්‍රම ක්‍රමයෙන් වැඩි වන රියේ වේගය වේගමානයෙන් අනුරාධ ට පෙනෙයි. ඔහු වේගමානය දෙසත් දිලීප දෙසත් මාරුවෙන් මාරුවට බැලුවේ ය.

''අනුරාධ.. අපි දෙන්නට කතා කරන්න තරම් දෙයක් තියෙනව ද..?" දිලීප සන්සුන් ලෙස ඇසුවේ ය.

''ඒ කිව්වෙ..?''

''අපි දෙන්නම එකම ගෑණියෙකුට ආදරේ කරනවා... ඒ සටනින් ඔයා දිනුම්.. ඒත් ඒ දිනුම ඔයාට දීලා බලං ඉන්න මගේ හිත ඉඩ දෙන්නෙ නෑ.. මට දිනුමක් ලැබෙන්නෙත් නෑ.. ඔයා හිතනවද මට ආත්මාර්ථකාමීකම අහකට දාලා ඔය දෙන්නා එකතු වෙනවා බලං ඉන්න පුලුවන් කියලා..? ඒක කවදාවත් කෙරෙන්නෙ නෑ අනුරාධ.. දැන් අපි දෙන්නම මේ වේදිකාවෙන් අයින් වෙන්න ඕනෙ.. ඔව්.. අපි දෙන්නම..''

ලබන කලාපයට

